WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**16 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## ඉස්ලාම් I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** විශ්වාසය පිළිබඳ ඉස්ලාමීය සිද්ධාන්තය දක්වන අරාබි පදය වනුයේ,
(1) ෂරීආ යන්න ය. (2) දීන් යන්න ය. (3) ෆික්හු යන්න ය. (4) අකීදා යන්න ය.

**2.** කුෆ්රය යන්න,
(1) ආගම වෙනස් කිරීමයි. (2) දෙවියන් ප්‍රතික්ෂේප කිරීමයි.
(3) වංචනිකත්වයයි. (4) මුනිවිචාවයි.

**3.** ඉස්ලාමීය අකීදාව ආරක්ෂා කිරීම සඳහා වෙහෙස වූ විද්වතුන්ගේ නම් පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) ඉමාම් මාලික් (රහ්), ඉමාම් අබුල් හසන් අල්-අෂ්අරි (රහ්), ඉමාම් ශුහරි (රහ්)
(2) ඉමාම් මාතුරුදි (රහ්), ඉමාම් අබුහනීෆා (රහ්), ඉමාම් අහ්මදු ඉබ්නු හන්බල් (රහ්)
(3) ඉමාම් අබුල් හසන් අල්-අෂ්අරි (රහ්), ඉමාම් අහ්මදු ඉබ්නු හන්බල් (රහ්), ඉමාම් මාතුරුදි (රහ්)
(4) ඉමාම් අබුල් හසන් අල්-අෂ්අරි (රහ්), ඉමාම් මාතුරුදි (රහ්), ඉමාම් ශුහරි (රහ්)

**4.** වචනය පිළිබඳ රිද්දතයට උදාහරණයක් වන්නේ,
(1) පොලී ගැනීමයි. (2) නබිවරුන් ගැන අපහාසාත්මකව කතා කිරීමයි.
(3) අල්-කුර්ආනය ගිනි තැබීමයි. (4) අල්ලාහ් විශ්වාස නොකිරීමයි.

**5.** 'අල්-මාඋත් තහුර්' යනු,
(1) පිරිසිදු කිරීමේ හැකියාව ඇති ජලයයි. (2) පිරිසිදු ජලයයි.
(3) ප්‍රයෝජනයට ගත් ජලයයි. (4) අපිරිසිදු ජලයයි.

WWW.OLEVELAPI.COM

**6.** කුල්ලතෛන්වලට අඩු ජලයේ නජීස් මිශ්‍ර වීමකින් එහි රසය, පාට, සුවඳ යනාදියේ කිසිදු වෙනසක් සිදු වී නැති විටක එම ජලය වුලූ කිරීම සඳහා,
(1) සාමාන්‍යයෙන් භාවිත කළ හැකි ය. (2) භාවිත නොකළ යුතු ය.
(3) භාවිත නොකිරීම සුදුසු ය. (4) වැළැක්විය නොහැකි අවස්ථාවක පමණක් භාවිත කළ හැකි ය.

**7.** පහත සඳහන් ඒවායින් ෆර්ල් කිෆායා වූ ක්‍රියාවක් වන්නේ,
(1) පස්වේල් සලාතයයි. (2) රමළාන් උපවාසයයි.
(3) හජ් නැමදුමයි. (4) සමාජ සුභසාධන ක්‍රියාකාරකමකි.

**8.** "සත්‍ය සලාතය අවනම්බුව ගෙන දෙන ඒවා වළක්වයි" යන්න,
(1) අල්-කුර්ආනයේ ප්‍රකාශයකි. (2) නබි (සල්) තුමාගේ ප්‍රකාශයකි.
(3) සහාබිවරයකුගේ කියමනකි. (4) ඉමාම් ෂාෆිඊ (රහ්) ගේ කියමනකි.

**9.** සකාත් නිසාබ් වූ අවස්ථාවේ ශ්‍රී ලංකා මුදලින් රු 500 000 ක් අතැති කෙනෙකු වසර අවසානයේ ගෙවිය යුතු සකාත් ප්‍රමාණය,
(1) රු 10 000 කි. (2) රු 12 500 කි. (3) රු 15 000 කි. (4) රු 17 500 කි.

[ දෙවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**10.** සුන්නත් වූ සව්මයක් වන්නේ,
(1) රමළාන් සව්මයයි. (2) කලා සව්මයයි. (3) අරෆා සව්මයයි. (4) කෆ්ෆාරා සව්මයයි.

**11.** අයකු ළඟ අවුරුද්දක් මුළුල්ලේ ම එළුවන් 121 දෙනෙක් සිටින්නේ නම්, ඔහු සකාත් වශයෙන් දිය යුතු එළුවන් සංඛ්‍යාව,
(1) එකෙකි. (2) දෙදෙනෙකි.
(3) තුන්දෙනෙකි. (4) හතරදෙනෙකි.

**12.** හජ් සඳහා ඉහ්රාම් නිය්‍යතය තැබූ අයකුට අනුමත **නොවන** ක්‍රියාවකි,
(1) නෑම. (2) ඕපාදූප කතා කිරීම.
(3) සුවඳ ගල්වා ගැනීම. (4) සුන්නත් වූ සලාත ඉටු කිරීම.

**13.** අභාවයට පත් සැමියා වෙනුවෙන් 'ඉද්දා' ඉටු කරන කාන්තාවක අනිවාර්යයෙන් ම වැළකී සිටිය යුතු වන්නේ,
(1) ඉපැයීම සඳහා යෑමෙනි. (2) වෛද්‍යවරයා හමුවීමෙනි.
(3) විවාහ වීමෙනි. (4) ආහාර පිසීමෙනි.

**14.** ඉස්ලාමීය පාලනයේ හතරවන කලීෆාවරයා ලෙස පත්වූයේ,
(1) අබුබක්ර් (රළි) ය. (2) උමර් (රළි) ය. (3) උස්මාන් (රළි) ය. (4) අලි (රළි) ය.

**15.** ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථයක් වන්නේ,
(1) කලීලා වදිම්නා ය. (2) අජාඉබුල් හින්ද් ය.
(3) තස්කිරතුල් හුෆ්ෆාල් ය. (4) ෆික්හු සුන්නාහ් ය.

**16.** 'ඉජ්තිහාද්' යන පදයේ අර්ථය කුමක් ද?
(1) එක්රැස්වීම (2) වෑයම් කිරීම
(3) එකම මතයකට පැමිණීම (4) සැසඳීම

**17.** 'ඉස්ලාමීය නීතිමාලාව' යන අදහස දෙන අරාබි වචනය කුමක් ද?
(1) ඉල්මුල් ෆික්හ් (2) ඉල්මුල් තෆ්සීර් (3) ඉල්මුල් අකීදා (4) ඉල්මුල් මීරාස්

**18.** 'වෛද්‍ය විද්‍යාවේ පියා' යනුවෙන් හඳුන්වනු ලබනුයේ,
(1) අල්-කුවාරිස්මි ය. (2) ඉබ්නු ෆර්නාස් ය. (3) අල්-කින්දි ය. (4) අලි ඉබ්නු සීනා ය.

**19.** ළඊෆ් වූ හදීස් යනු,
(1) සාක්ෂි සහිත හදීස් ය. (2) දුර්වල හදීස් ය. (3) ගොතන ලද හදීස් ය. (4) ස්ථිර හදීස් ය.

**20.** සලාතයේ දී 'දුආඋල් ඉෆ්තිදාල්' උසුරන අවස්ථාව වනුයේ,
(1) පළමු තක්බීරයෙන් පසුව ය. (2) රුකූඋවේ දී ය.
(3) සුජූදයේ දී ය. (4) මැදි ඉඳුමේ දී ය.

**21.** අබ්බාසීය කිලාෆතයේ පළමු කලීෆාවරයා වූයේ,
(1) මුආවියා (රළි) තුමා ය. (2) හරූන් අල්-රෂීද් ය.
(3) අබුල් අබ්බාස් අස්සෆා ය. (4) පළමුවැනි අබ්දුල් රහුමාන් ය.

**22.** 'ආලිමුල් කුරයිෂ්' යන සුවිශේෂ නමින් හඳුන්වන ඉමාම්වරයා,
(1) ඉමාම් අබු හනීෆා (රහ්) තුමා ය. (2) ඉමාම් මාලික් (රහ්) තුමා ය.
(3) ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා ය. (4) ඉමාම් අහමද් ඉබ්නු හන්බල් (රහ්) තුමා ය.

**23.** උමයියාවරුන්ගෙන් පසුව ඉස්ලාමීය පාලනය භාර ගත්තේ,
(1) මෝගල්වරුන් ය. (2) උස්මාන්වරුන් ය. (3) අබ්බාසීයවරුන් ය. (4) ෆාතිමීවරුන් ය.

**24.** අරාබි භාෂාව රාජ්‍ය භාෂාව ලෙස ප්‍රකාශයට පත් කළ උමයියා වංශයේ කලීෆා වූයේ,
(1) කලීෆා යසීද්තුමා ය. (2) උමර් ඉබ්නු අබ්දුල් අසීස්තුමා ය.
(3) අබ්දුල් මලික් ය. (4) වලීද් ය.

**25.** පිරිසකගේ ප්‍රාග්ධනයත් තවත් පිරිසගේ ශ්‍රම දායකත්වයත් එක් වූ ආර්ථික ක්‍රියාවලිය,
(1) මුලාරබා ය. (2) මුෂාරකා ය. (3) මුසාරආ ය. (4) මුරාබහා ය.

**26.** 'කියාස්' මූලාශ්‍රයේ රුකුන් ගණන,
(1) දෙකකි. (2) තුනකි. (3) හතරකි. (4) පහකි.

[ තුන්වැනි පිටුව බලන්න

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

27. දික්කසාද වූ කාන්තාවකගේ ඉද්දා කාලය,
(1) දින හතළිහකි. (2) මාස හතරයි දින දහයකි.
(3) මාස් ශුද්ධි තුනකි. (4) දරු ප්‍රසූතිය සිදුවන තුරු ය.

28. පොළොව සශ්‍රීක කරන ක්‍රියාවලිය,
(1) ඉමාරත් වේ. (2) කිලාෆත් වේ. (3) දෑවා වේ. (4) රිසාලත් වේ.

29. විවාහ ගිවිසුමකින් සැමියා බිරිඳගෙන්, නීත්‍යානුකූල ව වෙන්වීම,
(1) ෆස්කු ය. (2) කුල්උ ය. (3) ඊලාඋ ය. (4) තලාක් ය.

30. කලීෆා අබුබක්ර්(රළි) තුමාගේ යෝජනාව පරිදි අල්-කුර්ආනය ගොනු කිරීමේ කාර්යය ඉටු කළ නබිතුමාගේ මිත්‍රයා වූයේ,
(1) ඉබ්නු අබ්බාස් (රළි) ය. (2) සයිද් බින් සාබිත් (රළි) ය.
(3) මුආද් ඉබ්නු ජබල් (රළි) ය. (4) ඉබ්නු මස්ඌද් (රළි) ය.

31. බද්ර් යුද්ධයට සහභාගී වූ සහාබිවරුන්ගේ සංඛ්‍යාව,
(1) 300 කි. (2) 313 කි. (3) 1000 කි. (4) 1200 කි.

32. මක්කා ජයග්‍රහණය සිදු වූ වසර,
(1) හිජ්රි 5 ය. (2) හිජ්රි 6 ය. (3) හිජ්රි 7 ය. (4) හිජ්රි 8 ය.

33. සව්මය අනිවාර්ය කළ වසර,
(1) හිජ්රි 1 වේ. (2) හිජ්රි 2 වේ. (3) හිජ්රි 3 වේ. (4) හිජ්රි 6 වේ.

34. මිනා, සෆා, මර්වා, මුස්තලිෆා ආදී ස්ථාන හා සම්බන්ධ නැමදුම,
(1) උම්රා ය. (2) සව්ම් ය. (3) හජ් ය. (4) සලාත් ය.

35. නබි (සල්) තුමා මක්කාවේ ජීවත් වූ කාලය,
(1) වසර 10 කි. (2) වසර 40 කි. (3) වසර 53 කි. (4) වසර 63 කි.

36. 'කිතාබුල් හයවාන්' නම් ග්‍රන්ථයේ කර්තෘවරයා,
(1) අල්-ජාහිස් ය. (2) අර්-රාසි ය. (3) ඉබ්නු නෆීස් ය. (4) ගලන් ය.

37. පහත **'අ'** තීරුවේ කර්තෘවරුන් කිහිප දෙනකුගේ නම් ද **'ආ'** තීරුවේ ඔවුන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ කිහිපයක නම් ද දැක්වේ.

| **'අ'** තීරුව | **'ආ'** තීරුව |
|---|---|
| (i) – ඉමාම් ෂාෆිඊ (රහ්) | A – මුඅත්තා |
| (ii) – ඉමාම් අබූහනීෆා (රහ්) | B – සහීහුල් බුහාරි |
| (iii) – ඉමාම් බුහාරි (රහ්) | C – කිතාබුල් උම්මු |
| (iv) – ඉමාම් මාලික් (රහ්) | D – ෆික්හුල් අක්බර් |

ඉහත **'ආ'** තීරුවේ ග්‍රන්ථවල නම් **'අ'** තීරුවේ කර්තෘවරුන්ගේ නම්වලට අනුපිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර දැක්වෙන වරණය තෝරන්න.
(1) ACBD (2) ACDB (3) BDAC (4) CDBA

WWW.OLEVELAPI.COM

- **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පහත සිද්ධිය පදනම් කරගෙන පිළිතුරු සපයන්න.

මරණාසන්න ව සිටින අයකු තමාට අයත් රුපියල් ලක්ෂ 6 ක මුදලින් 1/2 කොටස දන් දෙන ලෙසත් ඉතිරි මුදල නෑයින් අතර බෙදා දෙන ලෙසත් නියම කර මළේ ය. මෙහි දී,

38. දන්දීම යන්න දක්වන අරාබි වචනය,
(1) නුස්රත් ය. (2) වක්ෆු ය. (3) සදකා ය. (4) තස්කියා ය.

39. දන් දෙන ලෙස එම මිනිසා අණ කළ බව දක්වන අරාබි වචනය කුමක් ද?
(1) වරාසත් (2) වසිය්යත් (3) වකාලත් (4) අමානත්

40. එම පුද්ගලයාගේ මුළු දේපළවලින් දන් දීම පිණිස ඉස්ලාම් නීතියෙන් අනුමත ප්‍රමාණය,
(1) රුපියල් ලක්ෂයකි. (2) රුපියල් ලක්ෂ දෙකකි.
(3) රුපියල් දෙලක්ෂ පනස්දහසකි. (4) රුපියල් ලක්ෂ තුනකි.

* *

[ හතරවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....